# දකුණු පළාතේ සමුපකාර සමිති ශ්‍රේණිගත කිරීම

# 2021/2022

## සේවා හා නිශ්පාදන සමුපකාර සමිති ශ්‍රේණිගත කිරීම

## නිර්ණායක අත්පොත

## සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව

## දකුණු පළාත

## දකුණු පළාතේ සමුපකාර සමිති ශ්‍රේණිගත කිරීම - 2021/2022

**හැඳින්වීම**

දකුණු පළාතේ සමුපකාර ව්‍යාපාරයේ අඛණ්ඩ පැවැත්ම සාධනය කරමින් ධනාත්මක අභිප්‍රේරණයන් සහිතව සංවර්ධනාත්මක ගමනකට දිශාගත කරනු පිණිස කාර්යක්ෂම හා ඵලදායි සමුපකාර සමිති ඇගයීම පිණිස දකුණු පළාත් සමුපකාර අමාත්‍යාංශයේ උපදේශකත්වය යටතේ දකුණු පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව ක්‍රියාවට නංවන වැඩසටහනකි.

**මූලික කරුණු**

- දකුණු පළාත තුළ මෙම ශ්‍රේණිගත කිරීම හා කාර්යසාධන තරඟාවලිය දෙවන වරට සංවිධානය කරනු ලැබේ.
- ඇගයුම් කිරීම 2022 වර්ෂය පදනම් කර ගනිමින් 2024 වර්ෂයේදී සිදු කරනු ලැබේ.
- අයදුම්පත් නිවැරදිව, පැහැදිලිව හා විධිමත්ව ඉදිරිපත් කිරීම ඇගයුම් කටයුතු වලදී සැලකිල්ලට ගන්නා බැවින් ඔබගේ ප්‍රමුඛ අවධානය ඒ සඳහා යොමු විය යුතුය.
- දකුණු පළාතේ ලියාපදිංචි සියළුම සමුපකාර සමිති හා සංගම් මෙම ශ්‍රේණිගත කිරීම හා කාර්යසාධන තරඟාවලිය සඳහා තොරතුරු ඉදිරිපත් කල යුතුය.
- තොරතුරු ඉදිරිපත් කරන සියළුම සමිති ශ්‍රේණිගත කිරීම සඳහා අදාල කර ගන්නා අතර 2023.05.31 දින දක්වා වන මුදල් වර්ෂයට අදාලව සම්පූර්ණ අවසාන ගිණුම් සකස්කර එකී ගිණුම් දිස්ත්‍රික් සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කර ඇති සමිති කාර්යසාධන තරඟාවලිය සඳහා අදාල කරගනු ලැබේ.

සමුපකාර සමිති විසින් අත්පොතෙහි දක්වා ඇති නිර්ණායකයන්ට අනුව සනාථ කල හැකි තොරතුරු මත ස්වයං ලකුණු සටහන් කිරීමක් කල යුතුය. මෙම කාර්යය සඳහා ඔබ සමිතියේ වගකිවයුතු නිලධාරීන් හරහා සිදුකර ඔබ වෙත නිකුත්කර ඇති අයදුම්පත විධිමත්ව හා නිවැරදිව සම්පූර්ණ කර 2024.04.30 දිනට පෙර ඉදිරිපත් කල යුතු අතර එහි නිවැරදි බව සහතික කරමින් සමිතියේ ගරු සභාපති හා සාමාන්‍යාධිකාරී/කළමණාකරු/ලේකම් විසින්ම අත්සන් කල යුතුය.

**යෝජිත ඇගයුම් ක්‍රමවේදය**

**අදියර 01 -** සමුපකාර සමිති විසින් ලබාදෙන නිර්ණායකයන්ට අනුව ලකුණු සටහන් පොතෙහි පළමු තීරුවේ සටහන් කල තොරතුරු ඇගයුමට ලක්කෙරේ. එහිදී සමිතිය විසින් ඉදිරිපත් කරන සනාථ කිරීමේ ලේඛණ ඇතුළු අයදුම්පත නිවැරදිව හා විධිමත්ව සම්පූර්ණ කර තිබේදැයි පරීක්ෂා කර, සමිතියේ අවසන් විගණිත වර්ෂයද සලකා බලා දෙවන ඇගයුම් අදියරට සුදුසුකම් ලබන සමිති තෝරා ගනු ලැබේ.

**අදියර 02 -** පළමු ඇගයුමෙන් තෝරා ගන්නා සමිති භෞතිකව ඇගයුම මෙම අදියරේදී සිදුකෙරේ. මෙම ඇගයුම සඳහා සුදුසු පරිදි ඇගයුම් හා අධීක්ෂණ නිලධාරීන් සමුපකාර සංවර්ධන කොමසාරිස් විසින් පත් කරනු ඇත. මෙම ඇගයුමේදී සමිතිය විසින් සටහන් කල ලකුණු ඇගයුම් නිලධාරීන් විසින් සත්‍යාපනය කරනු ලැබේ. එහෙත්

ලකුණු එකතු කර සමිතිය ලැබූ මුළු ලකුණු සංඛ්‍යාව මෙහිදී ගණනය නොකරන අතර ලකුණු සටහන් පොත හා අදාල ලේඛණ සමිති නිලධාරීන් ඉදිරියේ විධිමත්ව මුද්‍රා තබනු ලැබේ.

**අදියර 03 -** මුද්‍රා තබන ලද ප්‍රතිඵල ලේඛණ මුද්‍රා ඉවත් කර ලකුණු එකතු කර ප්‍රතිපල ලේඛණ සකස් කිරීම මෙහිදී සිදුවේ. මෙම අදියර සඳහා ඇගයුම් හා අධීක්ෂණ නිලධාරීන් සුදුසු පරිදි සමුපකාර සංවර්ධන කොමසාරිස් විසින් පත් කරනු ඇත.

ශ්‍රේණිගත කිරීමට සමගාමීව කාර්යසාධන තරඟාවලිය පවත්වන්නේ නම් එක් එක් අංශයේ සම්මාන සඳහා තෝරාගන්නා සමිති යළි ඇගයීමක් සිදු කරන අතර එම ඇගයීම මත හේතු පාඨ සැකසීම, වීඩියෝගත කිරීම ඇතුළු කටයුතු සිදු කෙරේ. මෙම අදියරේදී තෝරා ගන්නා සමිති සම්බන්ධ තොරතුරු (ප්‍රතිඵල) සම්මාන දින දක්වා රහසඈව තැබෙනු ඇත. එම ඇගයුම සඳහා දකුණු පලාත් සමුපකාර සංවර්ධන කොමසාරිස්තුමාගේ මූලිකත්වයෙන් වන කමිටුවක් මඟින් සිදු කෙරේ.

මෙම ශ්‍රේණිගත කිරීමට අදාල පදනම වන්නේ ව්‍යවස්ථාපිත විගණනය සඳහා 2022 වර්ෂයට (2023.05.31 දක්වා) අදාලව ඔබ සමිතිය විසින් සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් කාර්යාලයට ඉදිරිපත් කර ඇති අවසාන ගිණුම් වේ. එහෙත් යම් සමිතියක් 2022 වර්ෂයට අදාල අවසාන ගිණුම් ඉදිරිපත්කර නොමැතිනම්, ඒ සඳහා 2021 වර්ෂයට අදාල අවසාන ගිණුම්ද, 2021 වර්ෂයට අදාල අවසාන ගිණුම් ඉදිරිපත් කර නොමැත්තේ නම් 2020 වර්ෂයට අදාල අවසාන ගිණුම් ද, මෙම ශ්‍රේණිගත කිරීම සඳහා යොදා ගැනීමට අවස්ථාව ඇත. 2021 වර්ෂයට අදාල අවසාන ගිණුම් පදනම් කර ගන්නේ නම් මුළු ලකුණු සංඛ්‍යාවෙන් ලකුණු 100 ද, 2020 වර්ෂයට අදාල අවසාන ගිණුම් පදනම් කර ගන්නේ නම් මුළු ලකුණු සංඛ්‍යාවෙන් ලකුණු 200 ද අඩු කරනු ලැබේ. 2020 වර්ෂයට පෙර වර්ෂයක් අදාල කර ගන්නේනම් මුළු ලකුණු සංඛ්‍යාවෙන් ලකුණු 300 අඩු කරනු ලැබේ.

| කාර්යය | යෝජිත කාලය |
|---|---|
| නිර්ණායක හා අයදුම්පත් පොත් සකසා මුද්‍රණය | **2024.03.30** |
| අයදුම්පත් කැඳවීම | **2024.04.05 – 2024.04.30** |
| විනිශ්චය මණ්ඩල පත්කිරීම හා දැනුවත් කිරීම | **2024.04.16-2024.04.30** |
| ඇගයුම අදියර 01 | **2024.05.06 -2024.05.30** |
| ඇගයුම අදියර 02 | **2024.06.01 - 2024.06.14** |
| ප්‍රතිඵල සමාලෝචනය | **2024.06.17-2024.06.28** |
| ප්‍රතිඵල නිකුත් කිරීම | **2024.07.06** |

වර්ගීකරණය හා ලබාගත යුතු අවම ලකුණු මට්ටම

| | |
|---|---|
| A ශ්‍රේණිය | - මුළු ලකුණු 800 වැඩි |
| B ශ්‍රේණිය | - මුළු ලකුණු 600-799 අතර |
| C ශ්‍රේණිය | - මුළු ලකුණු 450-599 අතර |
| D + ශ්‍රේණිය | - මුළු ලකුණු 350-449 අතර |
| D ශ්‍රේණිය | - මුළු ලකුණු **350** අඩු |

***** A ශ්‍රේණිය ලබා ගැනීමේදී අපේක්ෂිත ලකුණු 1000 නිරූපනය වන A,B,C යන කොටස් 03න් සෑම අංශයකින්ම 50%කට නොඅඩු ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතුය.**

***** යම් සමිතියක් මෙම ශ්‍රේණිගත කිරීම සඳහා ඉදිරිපත් නොවීම,නිවැරදි තොරතුරු සැපයීම පැහැර හැරීම හෝ අධීක්ෂණය සඳහා අවස්ථාව ලබා නොදීම යන අවස්ථා වලදී ඔවුනට D ශ්‍රේණිය හිමිවනු ඇත.**

අයදුම්පත් ඉදිරිපත් කල යුතු ආකාරය -

දකුණු පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන නිර්ණායක අත්පොත අනුව සම්පූර්ණ කරන ලද අයදුම්පත හා අදාල ඇමුණුම් <u>2024.04.30</u> දිනට පෙර ලැබෙන සේ <u>අංක 147/3, පෙට්ටිගලවත්ත, ගාල්ල ලිපිනයේ පිහිටි දකුණු පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තු ප්‍රධාන කාර්යාලයට</u> ගෙනවිත් භාර දීම හෝ ලියාපදිංචි තැපැල මඟින් යොමු කල යුතුවේ. ඔබ විසින් ඉදිරිපත් කරන අයදුම්පත හා අදාල අමුණුම් අඟල් 15x10 ප්‍රමාණයේ ලිපි කවරයක බහා මුද්‍රා තබා එහි වම්පස ඉහළ කෙළවරේ **"සමුපකාර සමිති ශ්‍රේණිගත කිරීම -2021/2022-සේවා හා නිශ්පාදන"** ලෙස සඳහන් කල යුතුය.

# දකුණු පළාත් කාර්ය සාධන තරගාවලිය
# සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව දකුණු පළාත.
# කාර්ය සාධන තොරතුරු හා ලකුණු ලබා දීමේ පිළිවෙළ
# සේවා සමූපකාර සමිති

<u>හැඳින්වීම</u>

සමූපකාර සමිතියකට ලබා ගත හැකි උපරිම ලකුණු සංඛ්‍යාව 1000 ක් වන අතර A,B හා C වශයෙන් මූලික අංශ තුනකින් කාර්ය සාධනය ඇගයීමට අපේක්ෂිතය. ලකුණු වෙන් කෙරෙන ආකාරය පහත දැක්වේ.

| | | |
|---|---|---|
| A සමූපකාර සමිතියේ ආර්ථික ස්ථායීභාවය | ලකුණු | 550 |
| B සමූපකාර සමිතියේ සාමාජික හා සමාජ සංවර්ධනය | ලකුණු | 300 |
| **C** නෛතික තත්වය | ලකුණු | 150 |
| **එකතුව** | | **1000** |

කාර්ය සාධනය ලක් කිරීමට A සහ B යන මූලික අංශ දෙකෙහි අන්තර්ගතයන් හා ලකුණු බෙදා හැරීම හෙවත් බර තැබීම පහත සඳහන් පරිදි වේ.

| **A ආයතනික ස්ථායීභාවය** | ලකුණු |
|---|---|
| 1. ලාභදායීතාවය | 30 |
| 2. හිමිකාරත්වය | 40 |
| 3. ආයතනික කාර්යසාධනය | 100 |
| 4. කාර්යක්ෂමතාවය | 40 |
| 5. ඵලදායීතාවය | 25 |
| 6. නව්‍යකරණය හා නිර්මාණකරණය | 70 |
| 7. මානව සම්පත් සංවර්ධනය | 80 |

| | |
|---|---|
| 8. භෞතික සම්පත් සංවර්ධනය/බාහිර පරිසරය | 65 |
| 9. කළමනාකරණය හා නායකත්වය | 50 |
| 10. අභ්‍යන්තර පාලනය | 50 |
| **එකතුව** | **550** |

| **B සාමාජික හා සමාජ සංවර්ධනය** | ලකුණු |
|---|---|
| 1. සමාජික සහභාගීත්වය | 70 |
| 2. සාමාජික ප්‍රතිලාභ (ආර්ථික) | 25 |
| 3. සාමාජික ප්‍රතිලාභ (සාමාජීය) | 25 |
| 4. ප්‍රජා සත්කාරය | 25 |
| 5. සමාජ වගකීම (ක්‍රියාකාරී බව ) | 25 |
| 6. සමුපකාර ගති ලක්ෂණ | 40 |
| 7. ආයතනික අරමුණු හා ප්‍රතිපත්ති ඉටු කිරීම | 90 |
| **එකතුව** | **300** |

| **C නෛතික තත්වය** | ලකුණු |
|---|---|
| 1. ආසන්නතම ගිණුම් වර්ෂයට විගණනය කර තිබීම | 30 |
| 2. 2022 ගිණුම් වර්ෂයට මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම | 20 |
| 3. ශේෂ පත්‍රයේ සඳහන් මූල්‍ය වංචා සහ අවභාවිතයන් සඳහා නීත්‍යානුකූල පියවර ගෙන තිබීම | 25 |
| 4. විගණන විමසුම් හා උපදෙස් අනුව ක්‍රියාමාර්ග ගෙන තිබීම | 25 |
| 5. සමුපකාර පනත, අතුරු ව්‍යවස්ථා ඇතුළු නෛතික ප්‍රතිපාදනයන්ට අනුගත වීම | 25 |
| 6. සමුපකාර අරමුදල සඳහා ගෙවීම් කර තිබීම | 25 |
| **එකතුව** | **150** |

## සමූපාකාර සමිතියෙහි ආර්ථික ස්ථායීභාවය - A කොටස

සමූපකාර සමිතියේ ආර්ථික ස්ථායීභාවය ඇගයීමට අදාළ කරුණුවල විස්තරාත්මක නිර්ණායකයන් හා වෙන් කළ ලකුණු ප්‍රමාණයන් සවිස්තරව පහත ඉදිරිපත් කෙරේ.

(01)

| විස්තරය | ලකුණු |
|---|---|
| **A. 01 ලාභදායිතාවය** | |
| A.01.01 ශුද්ධ ලාභය ඉපයීම | 20 |
| A.01.02 ශුද්ධ ලාභ වර්ධනය | 10 |
| **එකතුව** | **30** |

(02)

| විස්තරය | ලකුණු |
|---|---|
| **A. 02 හිමිකාරත්වය** | |
| A.02.01 මුළු වත්කම්වලට ස්කන්ධ දායකත්වය | 10 |
| A.02.02 මුළු වත්කම්වලට ආයතනික ප්‍රාග්ධනය | 10 |
| A.02.03 මුළු වත්කම්වලට කොටස් ප්‍රාග්ධනය | 10 |
| A.02.05 කොටසක පොත් අගය | 10 |
| **එකතුව** | **40** |

(3)

| විස්තරය | ලකුණු |
|---|---|
| **A. 03 කාර්යසාධනය** | |
| A.03.01 කාර්යාල පටිපාටීන් සරල කිරීම | 20 |
| A.03.02 සේවා සැපයීම් පටිපාටි වැඩිදියුණු කිරීම | 20 |
| A.03.03 විධිමත් කළමණාකරන ක්‍රමවේද ක්‍රියාත්මක කිරීම | 10 |
| A.03.04 සැලසුම්කරණය හා තීරණ ගැනීම | 10 |

| | |
|---|---|
| A.03.05  දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීම | 10 |
| A.03.06  තොරතුරු තාක්ෂණය භාවිතය | 25 |
| A.03.07 සන්නිවේදනය | 05 |
| **එකතුව** | **100** |

(04)

| විස්තරය | ලකුණු |
|---|---|
| **A. 04. කාර්යක්ෂමතාවය** | |
| A.04.01  ආයතනයේ අඛණ්ඩ පැවැත්ම | 20 |
| A.04.02  ආයතනයේ වියදම් පියවාගැනීමේ හැකියාව | 10 |
| A.04.03  ආයතනයේ මූල්‍ය ස්ථාවරත්වය | 10 |
| **එකතුව** | **40** |

(05)

| විස්තරය | ලකුණු |
|---|---|
| **A. 05 ඵලදායිතාවය** | |
| A.05.01  අනවශ්‍ය දෑ ඉවත් කර තිබීම | 05 |
| A.05.02  අවශ්‍ය දෑ පිළිවෙලකට තැබීම | 05 |
| A.05.03  ආයතන පරිශ්‍රය පිරිසිදුව පවත්වාගෙන යාම | 05 |
| A.05.04  ආයතන පරිශ්‍රයේ මනා පිළිවෙල අඛණ්ඩව පවත්වාගෙන යාම | 05 |
| A.05.05  පාලන නීති ස්ථාපිත වීම හා පුහුණු කිරීම | 05 |
| **එකතුව** | **25** |

(06)

| විස්තරය | ලකුණු |
|---|---|
| **A. 06 නව්‍යකරණය හා නිර්මාණකරණය** | |
| A.06.01 ආදායම් වර්ධනය හා පිරිවැය අවම කිරීමට සඳහා යොදා ඇති නව්‍යකරණය හා නිර්මාණකරණ වැඩසටහන් | 10 |
| A.06.02 ආයතනික පරිසර සකස්වීමේ නව්‍යකරණ හා නිර්මාණකරණය | 15 |
| A.06.03 ආයතනික ප්‍රතිරූපය ගොඩනැඟීමට කළ වැඩසටහන් / ක්‍රමවේද | 45 |
| එකතුව | **70** |

(07)

| විස්තරය | ලකුණු |
|---|---|
| **A. 07 මානව සම්පත් උපයෝජනය හා සංවර්ධනය** | |
| A.07.01 පිරිස්බල තක්සේරුවක් තිබීම | 25 |
| A.07.02 සේවකයින් බඳවා ගැනීම විධිමත් කාර්ය පරිපාටිවලට අනුකූල වීම. | 20 |
| A.07.03 සමස්ත කාර්ය මණ්ඩලයෙන් වෘත්තීය පුහුණුව ලබා දීම | 15 |
| A.07.04 සේවක සමාජ සංරක්ෂණ නිති ක්‍රියාත්මක වීම | 20 |
| එකතුව | **80** |

(08)

| විස්තරය | ලකුණු |
|---|---|
| **A. 08 භෞතික සම්පත් සංවර්ධනය** | |
| A.08.01 භෞතික සම්පත් ගොඩනැගීම | 25 |
| A.08.02 භෞතික සම්පත්වල ආරක්ෂාව සඳහා විධිවිධාන යොදා තිබීම | 20 |
| A.08.03 අනවශ්‍ය භෞතික සම්පත් බැහැර කිරීමේ ක්‍රියාදාමයක් පැවතීම | 20 |
| එකතුව | **65** |

(09)

| විස්තරය | ලකුණු |
|---|---|
| **A. 09 කළමනාකරණය හා නායකත්වය** | |
| A.09.01 ව්‍යාපාරය තත්ත්ව විශ්ලේෂණය කර තිබිම | 05 |
| A.09.02 සංවිධානයේ දර්ශනය පිළියෙළ කර තිබීම | 05 |
| A.09.03 සංවිධානයේ දර්ශනය ප්‍රචලිත කර තිබීම | 05 |
| A.09.04 සංවිධානයේ මෙහෙවර පිළියෙළ කර තිබීම | 05 |
| A.09.05 සංවිධානයේ මෙහෙවර ප්‍රකාශනය ප්‍රචලිත කර තිබීම | 05 |
| A.09.06 අදාළ කාලයේ මහා සභා තීරණ ක්‍රියාත්මක විම | 05 |
| A.09.07 අදාළ කාලයේ අධ්‍යක්ෂ මණ්ඩල/ කාරක සභා තීරණ ක්‍රියාත්මකවිම | 10 |
| A.09.08 අධ්‍යක්ෂ මණ්ඩල/ මහා සභා තීරණ සඳහා මාණ්ඩලික නිලධාරීන්ගේ දායකත්වය | 10 |
| **එකතුව** | **50** |

| විස්තරය | ලකුණු |
|---|---|
| **A. 10 අභ්‍යන්තර පාලනය** | |
| A.10.01 සමිතිය සංවිධාන ව්‍යුහයක් සකස් කර තිබීම හා ප්‍රදර්ශනය කර තිබීම | 02 |
| **A.10.02 සංවිධාන ව්‍යුහය අනුව බලතල හා වගකීම් පැවරීම** | |
| A.10.02.01 කාර්ය මණ්ඩල වෙත සේවා විභජන පත්‍ර ලබා දී තිබීම | 02 |
| A.10.02.02 කාර්ය සම්බන්ධ වගකිව යුත්තේ කාටදැයි යන්න පැහැදිලි වීම | 03 |
| **A.10.03 ගිණුම් පාලන ක්‍රම ස්ථාපිත වී තිබීම** | |
| A.10.03.01 දෛනිකව අත ඉතිරි සහතික සකස් කිරීම | 10 |
| A.10.03.02 දෛනිකව ගනුදෙනු තුලනය කිරීම | |
| A.10.03.03 ගිනුම් කටයුතු සම්බන්ධ ද්වන්ධ පාලනය | |
| A.10.03.04 කළමණාකරු හා කවුන්ටර් ලිපිකරුවන් අතර මුදල් හුවමාරුව ලිඛිතව සිදුවීම | |
| A.10.03.05 මුදල්,උකස් භාණ්ඩ,.... ද්වන්ධ පාලනයට නතුව තිබීම | |
| A.10.03.06 නිකුත් කළ ණය සඳහා කාරක සභා අනුමැතිය ලැබීම | |

| | |
|---|---|
| **A.10.04 ශේෂ පිරික්සුම පිළියෙළ කිරීම** | |
| A.10.04.01 මාසිකව නිවැරදිව ශේෂ පිරික්සුම පිළියෙළ කිරීම | 02 |
| A.10.04.02 මාසයේ 10 දිනට පෙර ශේෂ පිරික්සුම පිළියෙළ කිරීම | 02 |
| A.10.04.03 පොදු ලෙජරයේ ශේෂයන්ගෙන් පිළියෙළ කර තිබීම | 02 |

| | |
|---|---|
| **A.10.05 ආදායම් ප්‍රකාශන පිළියෙළ කිරීම** | |
| A.10.05.01 ගිණුම්කරණ ප්‍රමිතීන් අනුව ආදායම් ප්‍රකාශන පිළියෙළ කර තිබීම | 02 |
| A.10.05.02 ගිණුම් සටහන් මඟින් ගිණුම් විග්‍රහ කර තිබීම | 02 |
| **A.10.06 ශේෂ පත්‍රය පිළියෙළ කිරීම (මූල්‍ය තත්ත්ව ප්‍රකාශය පිළියෙළ කිරීම)** | |
| A.10.06.01 ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව පිළියෙළ කර තිබීම | 02 |
| A.10.06.02 ගිණුම් සටහන් මඟින් ගිනුම් විග්‍රහ කර තිබීම | 02 |
| **A.10.07 මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙළ කිරීම** | |
| A.10.07. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව පිළියෙළ කිරීම | 05 |
| **A.10.08 අභ්‍යන්තර පරික්ෂාව හා පාලන අදාළ කටයතු** | |
| A.10.08 අභ්‍යන්තර පරික්ෂාව හා පාලන අදාළ කටයතු | 05 |
| **A.10.09 පොත්පත් හා ලිපිගොනු භාරය** | |
| A.10.09.01 සමිතියේ පොත්පත් විෂය භාර අයගේ භාරයේ පැවතීම | 03 |
| A.10.09.02 සමිතියේ ලිපිගොනු විෂය භාර අයගේ භාරයේ පැවතීම | 03 |
| A.10.09.03 නීති කටයුතුවලට අදාළ පොත්පත් හා ලිපිගොනු විධායක නිලධාරියකුගේ භාරයේ ආරක්ෂා සහිතව තිබීම | 03 |
| **එකතුව** | **50** |
| **01-10 දක්වා ලකුණු එකතුව** | **550** |

**A කොටස ලකුණු ලබා දීමේ උපදෙස් විස්තරාත්මක පැහැදිලි කිරීම්**

**(1) ලාභදායීත්වය**

**ශුද්ධ ලාභය ඉපයීම**

**A.01.01** වෙන් කළ ලකුණු උපරිමය 20 කි.

ඇගයුම් කාලයට අදාල පදනම් වර්ෂයේ ලාභය ඉපයීම සඳහා ලකුණු 10 කි.
සමුච්චිත ලාභයක් තිබීම සඳහා ලකුණු 05 කි.
පෙර වර්ෂයට සාපේක්ෂව ලාභය වර්ධනය වී තිබීම ලකුණු 05 කි.
අලාභනම් පෙර වසරට සාපේක්ෂව ඌනතාවය අඩු කර ගැනීම ලකුණු 05 කි.

| සමිතියේ ලකුණු | විනිශ්චිත ලකුණු | |
|---|---|---|
| | 1 | 2 |
| | | |

**ශුද්ධ ලාභ වර්ධනය**

**A. 01.02** වෙන් කළ ලකුණු උපරිමය 10 කි. ප්‍රමිත ප්‍රතිශතය10% කි

$$\frac{\text{පෙර වසර ශුද්ධ ලාභය - මෙම වසර ශුද්ධ ලාභය}}{\text{පෙර වර්ෂයේ ශුද්ධ ලාභය}} \times 100$$

| සමිතියේ ලකුණු | විනිශ්චිත ලකුණු | |
|---|---|---|
| | 1 | 2 |
| | | |

| A-1 කොටස මුළු ලකුණු 30 | සමිතිය | වි. 1 | වි. 2 |
|---|---|---|---|
| | | | |

**ලකුණු පදනම**

ප්‍රමිත ප්‍රතිශතය ළඟා වීම හෝ ඊට වැඩි ලකුණු 20 ක් හිමි වේ. ඊට අඩු අනුපාතයක් සඳහා සමානුපාතිකව ලකුණු හිමි වේ.

**(02) හිමිකාරත්වය.**

**මුළු වත්කම් වලට ස්කන්ධ දායකත්වය**

**A.02.01** වෙන් කළ ලකුණු උපරිමය 10 කි. ප්‍රමිත මට්ටම 20% කි. ගණනය කරනුයේ පහත සඳහන් ආකාරයට ය.

$$\frac{\text{ස්කන්ධය}}{\text{මුළු වත්කම් (ශේෂ පත්‍රයේ එකතුව)}} \times 100$$

ස්කන්ධය ලෙස කොටස් ප්‍රාග්ධනය, ව්‍යවස්ථාපිත සංචිතය හා ඉතිරි ලාභ පමණක් අදාල කර ගනු ලැබේ.

| සමිතියේ ලකුණු | විනිශ්චිත ලකුණු | |
|---|---|---|
| | 1 | 2 |
| | | |

**ලකුණු පදනම**

ප්‍රමිත ප්‍රතිශතය 20% ක් හෝ වැඩි නම් ලකුණු10 කි. 20% වඩා අඩුවීමේදී ලබාගත් ප්‍රතිශතය මත සමානුපාතිකව ලකුණු හිමිවේ.

**මුළු වත්කම්වලට ආයතනික ප්‍රාග්ධනය.**

A.02.02 වෙන් කළ ලකුණු උපරිමය 10 කි. ප්‍රමිතිය 10% කි. ගණනය කරනුයේ පහත දැක්වෙන ආකාරයට ය.

$$\frac{\text{ආයතනික ප්‍රාග්ධනය x 100}}{\text{මුළු වත්කම් (ශේෂ පත්‍රයේ එකතුව)}}$$

**ආයතනික ප්‍රාග්ධනය = ස්කන්ධය - කොටස්**

| සමිතියේ ලකුණු | විනිශ්චිත ලකුණු | |
|---|---|---|
| | 1 | 2 |
| | | |

**ලකුණු පදනම**

ප්‍රතිශතය 10% ක් හෝ වැඩි නම් ලකුණු 10 කි. ඊට අඩු වන්නේ නම් ලබාගත් ප්‍රතිශතය මත සමානුපාතිකව ලකුණු හිමි වේ.

**මුළු වත්කම්වලට කොටස් ප්‍රාග්ධනය**

**A.02.03** වෙන් කළ ලකුණු උපරිමය 10 කි. ප්‍රමිත මට්ටම සී/ස සමිතියකට 10% කි. සී/ර සමිතියකට 5 % කි. ගණනය කරනුයේ පහත සඳහන් ආකාරයට ය.

$$\frac{\text{කොටස් ප්‍රාග්ධනය x 100 (කොටස්වල වටිනාකම)}}{\text{මුළු වත්කම් (ශේෂ පත්‍රයේ එකතුව)}}$$

| සමිතියේ ලකුණු | විනිශ්චිත ලකුණු | |
|---|---|---|
| | 1 | 2 |
| | | |

ප්‍රමිත මට්ටම වෙනුවෙන් ලකුණු 10 කි. ලබාගත් ප්‍රතිශතය අනුව සමානුපාතිකව ලකුණු හිමි වේ.

**කොටස් පොත් අගය**

A.02.04 වෙන් කළ ලකුණු උපරිමය 10 කි. මෙමගින් කොටසක සාමාන්‍ය පොත් අගය ගණනය කෙරේ. කොටසක වටිනාකම රු. 100 ක් ලෙස සැලකිය යුතු ය.

$$\frac{\text{සාමාජික හිමිකම් (ස්කන්ධය)}}{\text{සාමාන්‍ය කොටස් සංඛ්‍යාව}}$$

$$\text{සාමාන්‍ය කොටස් වටිනාකම} = \frac{\text{(ආරම්භක කොටස් වටිනාකම + අවසාන කොටස් වටිනාකම )}}{2}$$

$$\text{සාමාන්‍ය කොටස් සංඛ්‍යාව} = \frac{\text{සාමාන්‍ය කොටස් වටිනාකම}}{100}$$

| සමිතියේ ලකුණු | විනිශ්චිත ලකුණු | |
|---|---|---|
| | 1 | 2 |
| | | |

| A-2 කොටස මුළු ලකුණු 40 | සමිතිය | වි. 1 | වි. 2 |
|---|---|---|---|
| | | | |

ලකුණු ලබා දීමේ පදනම පහත දැක් වේ.
ප්‍රමිත වර්ධන කොටසක අගය රු. 500 ක් හෝ වැඩි නම් ලකුණු 10 කි. ලබාගත් අගය මත සමානුපාතිකව ලකුණු හිමිවේ.

**(3) ආයතනික කාර්ය සාධනය**

A.03.01 ආයතනයේ අභ්‍යන්තර කාර්යාල පටිපාටීන් සරල කල අවස්ථා 05 සඳහා වෙන් කළ ලකුණු උපරිමය 20 කි. තොරතුරු පහත වගුවට අනුව සරලව දැක්විය යුතු අතර ඇගයුම් අවස්ථාවේ අදාල සනාථ කිරීම් කල යුතුය.

| පැවති පටිපාටිය හෝ ගැටළුව (වැඩ පියවර ගණන සමඟ) | හඳුනාගත් ආකාරය | වැඩි දියුණු කල ආකාරය | ඉන් පසු පවතින පටිපාටිය (වැඩ පියවර ගණන සමඟ) | ලද ප්‍රතිපල |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |

| සමිතියේ ලකුණු | විනිශ්චිත ලකුණු | |
|---|---|---|
| | 1 | 2 |
| | | |

A.03.02 ආයතනය මඟින් සේවාලාභීන්ට සේවා සැපයීමේ ක්‍රියාවලීන් වැඩි දියුණු කල අවස්ථා 05 සඳහා වෙන් කළ ලකුණු උපරිමය 20 කි. තොරතුරු පහත වගුවට අනුව සරලව දැක්විය යුතු අතර ඇගයුම් අවස්ථාවේ අදාල සනාථ කිරීම් කල යුතුය.

| පැවති ක්‍රියාවලිය හෝ ගැටළුව (වැඩ පියවර ගණන සමඟ) | හඳුනාගත් ආකාරය | වැඩි දියුණු කල ආකාරය | ඉන් පසු පවතින පටිපාටිය (වැඩ පියවර ගණන සමඟ) | ලද ප්‍රතිපල |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |

| සමිතියේ ලකුණු | විනිශ්චිත ලකුණු | |
|---|---|---|
| | 1 | 2 |
| | | |

A.03.03 ආයතනය තුළ විධිමත් කාර්යාල කළමනාකරණ ක්‍රමවේද ක්‍රියාත්මක වන්නේනම් එවැනි ක්‍රියාමාර්ග 05 සඳහා ලකුණු 10 හිමිවේ..

I. ........................................................................................................................................

II. ........................................................................................................................................

III. ........................................................................................................................................

IV. ........................................................................................................................................

V. ........................................................................................................................................

| සමිතියේ ලකුණු | විනිශ්චිත ලකුණු | |
|---|---|---|
| | 1 | 2 |
| | | |

A.03.04 සැලසුම්කරණය හා තීරණ ගැනීම සඳහා අවශ්‍ය තොරතුරු ලබා ගන්නා ක්‍රමවේද 05 සඳහා ලකුණු 10 කි.

I. ..........................................................................................................................................
II. ..........................................................................................................................................
III. ..........................................................................................................................................
IV. ..........................................................................................................................................
V. ..........................................................................................................................................

| සමිතියේ ලකුණු | විනිශ්චිත ලකුණු | |
|---|---|---|
| | 1 | 2 |
| | | |

A.03.05 ආයතනික දත්ත පද්ධතිය යාවත්කාලීන කර තිබීම වෙනුවෙන් ලකුණු 04 හා යාවත්කාලීන කිරීම වෙනුවෙන් අනුගමනීය ක්‍රමවේද 03 සඳහා ලකුණු 06 ලෙස ලකුණු 10 හිමිවේ.

I. ..........................................................................................................................................
II. ..........................................................................................................................................
III. ..........................................................................................................................................

| සමිතියේ ලකුණු | විනිශ්චිත ලකුණු | |
|---|---|---|
| | 1 | 2 |
| | | |

A.03.06 ආයතනික කාර්යසාධනය ඉහළ නැංවීම සඳහා තොරතුරු තාක්ෂණය භාවිතා කිරීම වෙනුවෙන් උපරිමය ලකුණු 25 ක් හිමි වේ.

| | | |
|---|---|---|
| A.03.06.01 | අන්තර්ජාල පහසුකම් ලබා තිබීම | ලකුණු 03 |
| A.03.06.02 | නිල වෙබ් අඩවියක් තිබීම | ලකුණු 05 |
| A.03.06.03 | නිල වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම (සතිපතා) | ලකුණු 05 (මාසිකව නම් ලකුණු 03) |
| A.03.06.04 | විද්‍යුත් තැපැල් ලිපිනයක් තිබීම | ලකුණු 03 |
| A.03.06.05 | සමාජ මාධ්‍ය ජාලා භාවිතය | ලකුණු 02 |
| A.03.06.06 | කාර්යාල කටයුතු සඳහා පරිගණක භාවිතය | ලකුණු 05 |
| A.03.06.07 | මෙහෙයුම් කටයුතු සඳහා පරිගණක මෘදුකාංග භාවිතය | ලකුණු 02 |

| සමිතියේ ලකුණු | විනිශ්චිත ලකුණු | |
|---|---|---|
| | 1 | 2 |
| | | |

A.03.07 ආයතනික කාර්යසාධනය ඉහළ නැංවීම වෙනුවෙන් ඉහළ කළමනාකාරිත්වය හා කාර්ය මණ්ඩලය අතර සිරස් හා තිරස් සන්නිවේදනය සිදුවන ක්‍රමවේද 02 සඳහා ලකුණු 05.කි.

I. ..........................................................................................................................................
II. ..........................................................................................................................................

| සමිතියේ ලකුණු | විනිශ්චිත ලකුණු | |
|---|---|---|
| | 1 | 2 |
| | | |

| A-3 කොටස මුළු ලකුණු 100 | සමිතිය | වි. 1 | වි. 2 |
|---|---|---|---|
| | | | |

**(4) කාර්යක්ෂමතාවය හා ඵලදායීතාවය**

<u>ආයතනයේ අඛණ්ඩ පැවැත්ම</u>

**A.04.01** වෙන්කළ ලකුණු උපරිමය 20 කි.

**මුළු මූල්‍ය වත්කම් - මුළු මූල්‍ය වගකීම්**

ලකුණු පදනම = අගය ධන වේ නම් උපරිම ලකුණු හිමි වේ. ඍණ වේ නම් ලකුණු නැත.

| සමිතියේ ලකුණු | විනිශ්චිත ලකුණු | |
|---|---|---|
| | 1 | 2 |
| | | |

<u>මුළු වියදම් පියවා ගැනීමට මුළු ආදායම</u>

**A.04.02** වෙන් කළ ලකුණු උපරිමය 10 කි. ප්‍රමිත මට්ටම 115% ට වැඩි විය යුතු ය. ඊට අඩු වීමේදී සමානුපාතිකව ලකුණු හිමි වේ. අවමය 100% කි.

**<u>මුළු ආදායම x 100 ( ආදායම් ප්‍රකාශය අනුව)</u>**
**මුළු වියදම ( ආදායම් ප්‍රකාශය අනුව)**

| සමිතියේ ලකුණු | විනිශ්චිත ලකුණු | |
|---|---|---|
| | 1 | 2 |
| | | |

<u>ආයතනයේ මූල්‍ය ස්ථාවරත්වය</u>

**A.04.03** වෙන්කළ ලකුණු උපරිමය 10 කි. මෙහෙයුම් ක්‍රියාකාරිත්වය අනුව ලාභ වර්ධනය හා මුදල් හා මුදල් සමාන දැවල වර්ධනය පෙර වර්ෂය හා පදනම් වර්ෂය අනුව අගයනු ලැබේ.

| සමිතියේ ලකුණු | විනිශ්චිත ලකුණු | |
|---|---|---|
| | 1 | 2 |
| | | |

ලකුණු පදනම පහත දැක්වේ.

ලාභ වර්ධනය පෙර වසරට වඩා 10% වර්ධනයක් වීම ලකුණු 05
මුදල් හා මුදල් සමාන දෑ වල පෙර වසරට වඩා 10% වර්ධනයක් වීම ලකුණු 05 (මූල්‍ය තත්ව විශ්ලේෂණ වාර්තාව අනුව)

| A-3 කොටස මුළු ලකුණු 100 | සමිතිය | වි. 1 | වි. 2 |
|---|---|---|---|
| | | | |

**(5) <u>ඵලදායීතාව</u>**

**A.05.** නියමිත ලකුණු උපරිමය 25 කි. එස් 5 ක්‍රමවේද භාවිතය, තත්ව කව ක්‍රියාත්මක වීම අනුව භාවිතය හා ක්‍රියාකාරිත්වය නිරීක්ෂණය කර ලකුණු ලබා දේ. සනාථ කිරීමේ ලේඛණ හා තොරතුරු ඉදිරිපත් කිරීමෙන් පසු සමස්ථය නිරීක්ෂණය කර විනිශ්චය මණ්ඩලය විසින් ලකුණු ලබා දෙනු ලැබේ

A.05.01 අනවශ්‍ය දෑ ඉවත් කර තිබීම
A.05.02 අවශ්‍ය දෑ පිළිවෙලකට තැබීම
A.05.03 ආයතන පරිශ්‍රය පිරිසිදුව පවත්වාගෙන යාම
A.05.04 ආයතන පරිශ්‍රයේ මනා පිළිවෙල අඛණ්ඩව පවත්වාගෙන යාම
A.05.05 පාලන නීති ස්ථාපිත වීම හා පුහුණු කිරීම

| A-5 කොටස මුළු ලකුණු 25 | සමිතිය | වි. 1 | වි. 2 |
|---|---|---|---|
| | | | |

## (06) නව්‍යකරණය හා නිර්මාණකරණය

__ආදායම් වර්ධන හා පිරිවැය අවම කිරීමේ වැඩසටහන්__

**A.06.01** වෙන්කල ලකුණු උපරිමය 10 කි.ආදායම් වර්ධනය සඳහා හා පිරිවැය අවම කිරීම සඳහා යොදා ඇති වැඩසටහන් වෙනුවෙන් ලකුණු ලබා දීම සිදු කෙරේ. එම වැඩසටහන් ආදායම් වර්ධනයට හෝ පිරිවැය අවම කිරීමට යොදාගත් නව්‍යකරණ වැඩසටහන් සහ නිර්මාණකරණ වැඩසටහන් විය යුතු අතර පදනම් වර්ෂයට අදාල ව ක්‍රියාත්මක කර ඇති බව තහවුරු කළ යුතුවේ.

නව්‍යකරණ හෝ නිර්මාණකරණ වැඩසටහන් සඳහා එක් වැඩසටහනකට ලකුණු 05 බැගින් උපරිමය ලකුණු 20 කි.
(නිරික්ෂණ මට්ටමෙන් ලකුණු ලබා දිය යුතුය.පවත්වන ලද වැඩසටහනක් නිසා ආදායම් වැඩිවීම උපලේඛනයක් මඟින් සනාථ කර තිබිය යුතුය.)

| සමිතියේ ලකුණු | විනිශ්චිත ලකුණු | |
|---|---|---|
| | 1 | 2 |
| | | |

__ආයතනික පරිසර සකස්වීමේ නව්‍යකරණ හා නිර්මාණකරණය__

**A.06.02** වෙන්කල ලකුණු උපරිමය 15 කි. ආයතනික පරිසරය නව්‍යකරණ හා නිර්මාණකරණ මට්ටම නිරික්ෂණය කිරීමෙන් ලකුණු ලබා දේ.

| | |
|---|---|
| ආයතනික පරිසරයේ නව්‍යකරණය සතුටුදායක නම් | ලකුණු 08 |
| ආයතනික පරිසරයේ නව්‍යකරණය සාමාන්‍ය නම් | ලකුණු 04 |
| ආයතනික පරිසරයේ නිර්මාණකරණය සතුටුදායක නම් | ලකුණු 05 |
| ආයතනික පරිසරයේ නිර්මාණකරණය සාමාන්‍ය නම් | ලකුණු 03 |
| සමස්ත තත්වය | ලකුණු 02 |

නිරික්ෂණ මට්ටමින් ලකුණු ලබාදීම සිදු කෙරේ.

| සමිතියේ ලකුණු | විනිශ්චිත ලකුණු | |
|---|---|---|
| | 1 | 2 |
| | | |

**A.06.03** __ආයතනික ප්‍රතිරූපය ගොඩනැගීම__

**A.06.03.01** ආයතනික ප්‍රතිරූපය ඉහළ නැංවීම වෙනුවෙන් ගරු අධ්‍යක්ෂ මණ්ඩලය පෙන්වූ ආදර්ශයන් හෝ ක්‍රියාමාර්ගයන් 05ක් පදනම් වර්ෂයට අදාලව ඉදිරිපත් කිරීම වෙනුවෙන් ලකුණු 15 කි. (අදාල සනාථ කිරීම් කල යුතුය.)

**A.06.03.02** ආයතනික ප්‍රතිරූපය ඉහළ නැංවීම වෙනුවෙන් ඉහළ කළමනාකාරිත්වය (විධායක නිලධාරීන්) පෙන්වූ ආදර්ශයන් හෝ ක්‍රියාමාර්ගයන් 05ක් පදනම් වර්ෂයට අදාලව ඉදිරිපත් කිරීම වෙනුවෙන් ලකුණු 15 කි. (අදාල සනාථ කිරීම් කල යුතුය.)

**A.06.03.03** වෙන්කල ලකුණු උපරිමය 15 කි. ආයතනික ප්‍රතිරූපය ගොඩනැගීම සඳහා ක්‍රියාත්මක කල පොදු වැඩසටහන් නිරීක්ෂණය කිරීම තුළින් ලකුණු ලබා දීම සිදු කෙරේ. ආයතනික ප්‍රතිරූපය ගොඩනැගීම සඳහා ක්‍රියාත්මක කළ වැඩසටහන් සතුටුදායක නම් ලකුණු 15 සාමාන්‍ය නම් ලකුණු 10

- පාරිභෝගික සත්කාර
- සාමාජික සත්කාර
- සමුපකාර ප්‍රතිපත්ති බලගැන්වීම

මුදල් අක්‍රමිකතා, අවභාවිතයන් ලකුණු අඩු වීමට හේතු වේ.

| සමිතියේ ලකුණු | විනිශ්චිත ලකුණු | |
|---|---|---|
| | 1 | 2 |
| | | |

| A-6 කොටස මුළු ලකුණු 70 | සමිතිය | වි. 1 | වි. 2 |
|---|---|---|---|
| | | | |

**(7) මානව සම්පත් උපයෝජනය හා සංවර්ධනය**

<u>**පිරිස්බල තක්සේරුවක් තිබීම**</u>

**A.07.01** වෙන්කල ලකුණු උපරිමය 25 කි. ස්වේච්ඡාවෙන් කටයුතු කරයිනම් ව්‍යවස්ථානුකූලව සිදුවීම, සභාපති, ලේකම්, භාණ්ඩාගාරික, කාරක සභාව නිසි අයුරින් පත් කිරීම අනුව නිරීක්ෂණ මට්ටමින් ලකුණු හිමිවේ.

පිරිස්බලය සහිතනම්

| | | | |
|---|---|---|---|
| පිරිස්බල තක්සේරුව අනුමත වීම | ලකුණු 06 | පිරිස්බල තක්සේරුව යාවත්කාලීන වීම | ලකුණු 06 |
| සේවකයන් අනුයුක්ත වීම | ලකුණු 05 | අතිරික්ත සේවකයන් නොමැති වීම | ලකුණු 04 |
| වැඩබලන තනතුරු නොමැති වීම | ලකුණු 04 | | |

| සමිතියේ ලකුණු | විනිශ්චිත ලකුණු | |
|---|---|---|
| | 1 | 2 |
| | | |

<u>**සේවකයින් බඳවා ගැනීම**</u>

**A.07.02** වෙන්කල ලකුණු උපරිමය 20 කි. පදනම් වර්ෂයට ආසන්න වර්ෂ 03 තුළ සේවකයින් බඳවා ගැනීම විධිමත් කාර්ය පටිපාටිවල අනුකූලවීම මත ලකුණු හිමි වේ. එම කාලය තුළ සේවකයන් බඳවාගෙන නොමැත්තේනම් සම්පූර්ණ ලකුණු ලබා දේ. නිරීක්ෂණ මට්ටමින් ලකුණු හිමිවේ.

| | |
|---|---|
| ඉල්ලුම්පත් කැඳවීම | ලකුණු 04 |
| ඇගයුම් මණ්ඩලයක් සිටීම | ලකුණු 04 |
| විභාගයක්/පරීක්ෂණයක් පැවැත්වීම | ලකුණු 06 |
| ප්‍රමුඛතාව අනුව පත් කිරීම | ලකුණු 06 |

| සමිතියේ ලකුණු | විනිශ්චිත ලකුණු | |
|---|---|---|
| | 1 | 2 |
| | | |

<u>**සේවකයන් සඳහා වෘත්තීය පුහුණුව ලබාදීම**</u>

**A.07.03** වෙන්කල ලකුණු උපරිමය 15 කි.සමස්ථ කාර්ය මණ්ඩලයේ වෘත්තිය පුහුණු සහතික ලැබූ සේවක සංඛ්‍යාව මත ලකුණු හිමි වේ. ස්වේච්ඡා නිලධාරීන් නම් අවශ්‍ය පුහුණු ලබා දිය යුතුය.

<u>දිගුකාලීන පුහුණු වැඩ සටහන් උපරිමය ලකුණු 10 කි.</u>

සමුපකාර ඩිප්ලෝමා, උසස් පෙළ , සාමාන්‍යපෙළ, සහතික පත්‍ර වෘත්තිය පුහුණු ,පරිඝණක පුහුණු හා වෙනත් පුහුණු පදනම් කරගෙන
එක් සේවකයෙක් සිටීනම් එක සහතිකයකට ලකුණු 02 බැගින් හිමිවන අතර එක් සේවකයෙකුට වැඩිනම් එක සහතිකයකට ලකුණු 01 බැගින් හිමිවේ. සේවකයන් අඩු නම් ලකුණු ලබා දීමේදී ඒ පිළිබඳ අවධානය යොමු කල යුතුය.

<u>**කෙටිකාලීන පුහුණුව** වැඩ සටහන් උපරිමය ලකුණු 05 කි.</u>
**කෙටිකාලීණ එක් පුහුණු සහතිකයක් සඳහා එක ලකුණ බැගින් හිමිවේ.**
පුහුණුව ලැබූ බව සනාථ කළ යුතුයි.

| සමිතියේ ලකුණු | විනිශ්චිත ලකුණු | |
|---|---|---|
| | 1 | 2 |
| | | |

**සේවක සමාජ සංරක්ෂණ නීති**

**A.07.04** වෙන්කල ලකුණු උපරිමය 20 කි. සමාජ සංරක්ෂණ නීති ක්‍රියාත්මක වීම මත ලකුණු හිමිවේ.

අර්ථසාධක හා සේවා භාරකාර දඩ මුදල් ගෙවා නොමැති නම් ලකුණු 07
විශ්‍රාම පාරිතෝෂික මුදල් අස් වූ සේවකයින්ට ගෙවා තිබීම ලකුණු 06
සේවා භාරකාර අරමුදලට දායක වී තිබීම ලකුණු 04
විශ්‍රාම පාරිතෝෂික වෙන් කර ගිණුමක තැන්පත් කිරීම ලකුණු 03

| සමිතියේ ලකුණු | විනිශ්චිත ලකුණු | |
|---|---|---|
| | 1 | 2 |
| | | |

| A-7 කොටස මුළු ලකුණු 80 | සමිතිය | වි. 1 | වි. 2 |
|---|---|---|---|
| | | | |

**(8) භෞතික සම්පත් අත්පත්කර ගැනීම ආරක්ෂාව නඩත්තුව හා සංවර්ධනය**

**A.08.01.** **භෞතික සම්පත් ගොඩනැගීම** වෙන්කල ලකුණු උපරිමය 25 කි.

දේපළ පිරියත හා උපකරණ අත්පත් කර ගැනීම නඩත්තුව සංවර්ධනය සඳහා ගිණුම් කරන ප්‍රතිපත්තියක් සකස් කර තිබීම. ( ලකුණු 07)
දේපළ පිරියත හා උපකරණ ලේඛනයක් නඩත්තු කිරීම. ( ලකුණු 06)
භෞතික සම්පත් අත්පත් කර ගැනීම සඳහා අනුමැතිය ලබා ගැනීම. ( ලකුණු 07)
කාර්යාල පරිශ්‍රයේ අයිතිය සමිතිය සතු වීම . ( ලකුණු 05)
( බදු පදනම මත පවත්වාගෙන යන්නේ නම් ඇගයුම් දිනට සම්පූර්ණ බදු ගෙවා තිබීම සඳහා ලකුණු 03 ද, සමුපකාර සමිති පරිශ්‍රයක නම් ලකුණු 02 ද ලැබේ.බදු හිඟයක් වේ නම් ලකුණු හිමි නොවේ.)

| සමිතියේ ලකුණු | විනිශ්චිත ලකුණු | |
|---|---|---|
| | 1 | 2 |
| | | |

**A.08.02** **භෞතික සම්පත්වල ආරක්ෂාව සඳහා විධිවිධාන යොදා තිබීම** වෙන්කල ලකුණු උපරිමය 20 කි.

දේපළ පිරියත හා උපකරණ ආරක්ෂාව පිළිබඳ භාරකාරිත්වය පවරා තිබීම ( ලකුණු 07)
දේපළ පිරියත හා උපකරණ රක්ෂණය කිරීම. ( ලකුණු 06)
භෞතික සම්පත් සඳහා ආරක්ෂක උපක්‍රම භාවිතය ( ලකුණු 07)
( දොර ජනෙල් සඳහා අගුළු භාවිතය, ඉඩම්වල මායිම් සීමා ලකුණු කිරීම, පරිගණක සඳහා UPS භාවිතය, ආරක්ෂිත කබඩ්, ගිනි නිවන උපකරණ ආදිය භාවිතය ....)

| සමිතියේ ලකුණු | විනිශ්චිත ලකුණු | |
|---|---|---|
| | 1 | 2 |
| | | |

**A.08.03** **අනවශ්‍ය භෞතික සම්පත් බැහැර කිරීමේ ක්‍රියාදාමයක් පැවතීම** වෙන්කල ලකුණු උපරිමය 20 කි.

අනවශ්‍ය භෞතික සම්පත් හඳුනා ගැනීම . ( ලකුණු 07)
අනවශ්‍ය භෞතික සම්පත් බැහැර කිරීම සඳහා අනුමැතිය ලබා දීම. ( ලකුණු 07)
භෞතික සම්පත් බැහැර කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා කාරක නියෝග අනුව ක්‍රමානුකූලව කටයුතු කිරීම. ( ලකුණු 06)

| සමිතියේ ලකුණු | විනිශ්චිත ලකුණු | |
|---|---|---|
| | 1 | 2 |
| | | |

| A-8 කොටස මුළු ලකුණු 65 | සමිතිය | වි. 1 | වි. 2 |
|---|---|---|---|
| | | | |

## (9) කළමනාකරණ නායකත්වය

<u>ව්‍යාපාර තත්ව විශ්ලේෂණය</u>

**A.09.01** වෙන්කල ලකුණු උපරිමය 05 කි. ව්‍යාපාර තත්ව විශ්ලේෂණය කර තිබීම මත ලකුණු හිමිවේ. කළමනාකරණ තීරණ මත සනාථ කළ යුතුවේ.( ප්‍රස්ථාර , අනුපාත ආදිය මගින් )

| සමිතියේ ලකුණු | විනිශ්චිත ලකුණු | |
|---|---|---|
| | 1 | 2 |
| | | |

<u>දර්ශනය පිළයෙල කිරීම</u>

**A.09.02** වෙන්කල ලකුණු උපරිමය 05 කි. සංවිධානයේ දර්ශනය පිළියෙල කිරීම කිරීම මත ලකුණු හිමිවේ.කළමනාකරණ තීරණ මත සනාථ කළ යුතුවේ.

| සමිතියේ ලකුණු | විනිශ්චිත ලකුණු | |
|---|---|---|
| | 1 | 2 |
| | | |

<u>දර්ශනය ප්‍රචලිත කිරීම</u>

**A.09.03** වෙන්කල ලකුණු උපරිමය 05 කි. සංවිධානයේ දර්ශනය ප්‍රචලිත කිරීම මත ලකුණු හිමිවේ.කළමනාකරණ තීරණ මත සනාථ කළ යුතුය.

| සමිතියේ ලකුණු | විනිශ්චිත ලකුණු | |
|---|---|---|
| | 1 | 2 |
| | | |

<u>මෙහෙවර පිළියෙල කිරීම</u>

**A.09.04** වෙන්කල ලකුණු උපරිමය 05 කි. සංවිධානයේ මෙහෙවර පිළියෙල කර තිබීම මත ලකුණු හිමිවේ.කළමනාකරණ තීරණ මත සනාථ කළ යුතුය.

| සමිතියේ ලකුණු | විනිශ්චිත ලකුණු | |
|---|---|---|
| | 1 | 2 |
| | | |

**මෙහෙවර ප්‍රවලිත කිරීම**

**A.09.05** වෙන්කල ලකුණු උපරිමය 05 කි. සංවිධානයේ මෙහෙවර ප්‍රවලිත කිරීම මත ලකුණු හිමිවේ.කළමනාකරණ තීරණ හා ලිඛිත ප්‍රතිපත්ති මත ලකුණු ලබා දිය යුතුවේ මත සනාථ කළ යුතුය.

| සමිතියේ ලකුණු | විනිශ්චිත ලකුණු | |
|---|---|---|
| | 1 | 2 |
| | | |

A.09.06 **මහා සභා තීරණ ක්‍රියාත්මක කිරීම** (වෙන්කල ලකුණු උපරිමය 05 කි.)

මහා සභා තීරණ ක්‍රියාත්මක කිරීමේ තත්වයන් මත ලකුණු හිමිවේ.
සියළුම මහා සභා තීරණ ක්‍රියාත්මක කර තිබීම ලකුණු 05
( පසුගිය වසර 03 ක මහා සභා තීරණ පහත දැක්වෙන ආකෘතිය අනුව ඉදිරිපත් කල යුතුය.)

| දිනය | මහා සභා තීරණය | ක්‍රියාත්මක කල දිනය |
|---|---|---|
| | | |
| | | |

| සමිතියේ ලකුණු | විනිශ්චිත ලකුණු | |
|---|---|---|
| | 1 | 2 |
| | | |

**A.09.07** **අධ්‍යක්ෂ මණ්ඩල/කාරක සභා තීරණ ක්‍රියාත්මක කිරීම** (වෙන්කල ලකුණු උපරිමය 10කි)

අධ්‍යක්ෂ මණ්ඩල/කාරක සභා තීරණ ක්‍රියාත්මකවීම මත ලකුණු හිමිවේ.
සියළුම අධ්‍යක්ෂ මණ්ඩල/කාරක සභා තීරණ ක්‍රියාත්මක කිරීම ලකුණු 05
මාණ්ඩලික පත්‍ර/න්‍යාය පත්‍ර මගින් තීරණ ගැනීම ලකුණු 05

| දිනය | මාණ්ඩලික පත්‍ර/න්‍යාය පත්‍ර අ | අධ්‍යක්ෂ මණ්ඩල/ කාරක සභා තීරණය | ක්‍රියාත්මක කල දිනය |
|---|---|---|---|
| | | | |
| | | | |

| සමිතියේ ලකුණු | විනිශ්චිත ලකුණු | |
|---|---|---|
| | 1 | 2 |
| | | |

